# කොවිඩ් 19 - සති පාසල 10 ශ්‍රේණිය

## 7 වන පාඩම - වියළි කලාපයේ පැරණි නගර පිරිහීම සහ නව රාජධානි බිහි වීම.

සැකසුම - M.P.A ප්‍රදීප් කුමාර

කෑ / දෙහි කිතලංගමුව ක . වි

(1) නිපුණතාවය - රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය සහ බිඳ වැටීම නිසා සමාජයේ විවිධ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම් විග්‍රහ කරයි.

නිපුණතා මට්ටම - රජරට ශිෂ්ටාචාරය බිඳ වැටුණු ආකාරය විමසා බලා ස්ථාවර රාජ්‍යයක් පවත්වාගෙන යාමට කරුණු ගොනු කරයි.

විෂය සන්ධාරය / පාඩම - වියළි කලාපීය පැරණි නගර පිරිහීම හා හා නව රාජධානි බිහිවීම.

(2) ඉගෙනුම් ඵල - නගර බිහි වීමට හේතු පහදයි.

වියළි කලාපීය පැරණි නගර බිඳවැටීමට හේතු දක්වයි.

රාජ්‍යයක ස්ථාවර පැවැත්මට හේතු විග්‍රහ කරයි.

(3) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

දුවේ පුතේ ඔබ 6 , 7 , 8 ශ්‍රේණි වලදී රජරට ශිෂ්ටාචාරය සහ ඉන්පසු බිහි වූ රාජධානි පිළිබඳව තොරතුරු අධ්‍යනය කළා. අද අපි එම තොරතුරු පිළිබඳව තවත් ගැඹුරින් සහ විස්තරාත්මකව මෙම පාඩම තුළින් අධ්‍යනය කරමු. එහිදී ඔබ කලින් පාඩම් වලදී ඉගෙනගත් රජරට ශිෂ්ටාචාරය සහ දඹදෙණිය , යාපහුව , කුරුණෑගල ගම්පොළ කෝට්ටේ යන යුගයන්ට අදාළ තොරතුරු සමඟ මේවා පාඩමේ එන කරුණු සසඳා බැලීමේ දී ඒ පිළිබඳව නැඹුරු සහ විස්තරාත්මක අවබෝධයක් ලබාගත හැකිය.

මේ අනුව සිතා බලා ඔබ පහත ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

එහිදී 6 , 7 , 8 ශ්‍රේණිවලට අයත් ඉතිහාසය පෙළපොත සහ 10 ශ්‍රේණියේ පෙළපොත හොඳින් අධ්‍යනය කරන්න.

ක්‍රියාකාරකම

(1) පැරණි ශ්‍රී ලංකාවේ පළමු වන නාගරීකරණ අවධියට අයත් වන ප්‍රධාන නගර මොනවා ද?

(2) මෙරට තුළ නාගරික ජනතාවක් බිහිවීමට බලපෑ හේතු මොනවා ද?

(3) පළමු නාගරික අවධියේ නාගරික ජීවිතය තුළ දැක ගත හැකි වූ ප්‍රධාන ලක්ෂණ මොනවා ද?

(4) මුල් කාලීන පාලකයින් සිය පරිපාලන අගනුවර තෝරා ගැනීමේ දී අවධානයට යොමු කළ ප්‍රධාන ලක්ෂණ මොනවා ද ?

(5) අතීතයේ මෙරට පරිපාලන කටයුතු වලදී ඉන්දියන් සාගරයේ ක්‍රියාත්මක වූ අන්තර්ජාතික වෙළඳාමෙහි බලපෑමක් ඇති වූ බවට සාධක සපයන්න.

(6) පොළොන්නරුව පරිපාලන මධ්‍යස්ථානයේ බිඳ වැටීමට බලපෑ හේතු මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

(4) **ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි පොත්පත් , වෙබ් අඩවි බැලීමෙන් සහ ඉගෙනුම් ආධාරක දුවේ පුතේ පහත සඳහන් පොත් කියවීමෙන් , වෙබ් අඩවි බැලීමෙන් සහ ඉගෙනුම් ආධාරක භාවිතයෙන් භාවිතයෙන් ආධාරක භාවිතයෙන් ඔබට තවත් තොරතුරු එකතු කර ගැනීමට පුලුවන්**.

**i)** **e** තක්සලාව

**ii)** **e** නැණ පියස - **http : // www. enanapiyasa.lk**

**iii)** **youtube** නාලිකාවේ අදාල මාතෘකාවට අදාලව ඇති විස්තර රූප සටහන් සහ සිතියම්

**iv)** පොත්පත්

රජරට ශිෂ්ටාචාරය සහ නිරිත දිග රාජධානි - මහාචාර්ය ඉන්ද්‍රකීර්ති සිරිවීර

අ . පො . ස ( උ . පෙළ ) ඉතිහාසය I හා II කොටස් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය I හා II කොටස් - මහාචාර්ය එම් . ටී බස්නායක

6 , 7 , 8 , 10 ශ්‍රේණියේ පෙළපොත - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

10 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව